**9 වන වගන්තිය යටතේ වෙනස්කම් ප්‍රකාශයක් (සංශෝධනයක් ) ඉදිරිපත් කිරීම.**

**(ගාස්තුව = රු.3000)**

1. අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම. එහි සියලුම වෙනස්වීම් ඇතුලත් කර අයිතිකරු /අයිතිකරුවන් අත්සන් කල යුතුය.
2. රු.50ක මුද්දරයක් සහිතව සාමදාන විනිශ්චයකරුවෙක් විසින් දිවුරුම් ප්‍රකාශනයක් ලබා දිය යුතුය. (ආකෘතිය අමුණා ඇත. )
3. ව්‍යාපාරයේ වෙනස්කමක් කර ඇති නම් එය ව්‍යාපාරය ස්ථාපිත ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වෙතින් ලබා ගන්නා වාර්තාව (ආකෘතිය අමුණා ඇත. )
4. ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද අයිතිකරු /අයිතිකරුවන්ගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපත. (අයිතිකරු හෝ හවුල්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පිටත පදිංචිව සිටිනම් අදාළ ග්‍රාම නිලධාරී විසින් තහවුරු කරන ලද පදිංචි සහතිකය.
5. ව්‍යාපාරය ස්ථාපිත ප්‍රදේශයට අදාලව ප්‍රාදේශීය සභාවෙන් ලබා ගන්නා වෙළඳ බලපත්‍රය.

ව්‍යාපාර ස්ථානයේ ලිපිනය වෙනස් වීමකදී,

6. හිමිකම පැවරුණු බවට තහවුරු කරනු ලබන ඔප්පුවෙහි / බදු ගිවිසුමෙහි ව්‍යාපාරය පවත්වාගෙන යන ඉඩමට අදාළ ඔප්පුව බවට ග්‍රාම නිලධාරී විසින් සහතික කල යුතුය.
7. ව්‍යාපාරය පිහිටි භූමියෙහි /ගොඩනැගිල්ලෙහි අයිතිය ව්‍යාපාරය අයිතිකරුට නොමැති විට අදාළ අයිතිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය (සබඳතාවය තහවුරු කල යුතුය) ග්‍රාම නිලධාරී ඉදිරිපිට අත්සන් කර අයිතිකරුගේ අනන්‍යතාවය තහවුරු කල යුතුය.
8. ව්‍යාපාර නාමය ලියාපදිංචි කරන අවස්ථාවේ ලබා දෙන ලද ව්‍යාපාර නාම සහතිකයේ මුල් පිටපත.
9. අවස්ථානුකූලව ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලුම් කරනු ලබන ලියවිලි.
10. ව්‍යාපාරයක වෙනස්කමක් සිදුකල මාසයක් ඇතුලත ලියාපදිංචිය සිදු කරයි නම් ඒ සඳහා දඩ මුදලක් අය නොකෙරේ. නමුත්, මාසයක් ඉකුත් වූ විට එම මාසයද ඇතුලත්ව රු. 500 බැගින් දඩ මුදලක් අය වේ.

කිසිදු ව්‍යාපාරයක එකවර ව්‍යාපාර නාමය සහ ව්‍යාපාරයේ ස්වභාවය වෙනස් කල නොහැක. එකවරකදී ව්‍යාපාර නාමය වෙනස් කර මාස 6ක් ඉකුත්ව ගිය පසු ව්‍යාපාරයේ ස්වභාවය වෙනස් කල හැකිය.

**සහතික පිටපතක් ලබා ගැනීම (ගාස්තුව = රු.1500)**

1. අයදුම් පත්‍රය
2. ග්‍රාම නිලධාරී සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි පිටපත
3. සහතිකය අස්ථානගත වී ඇත්නම් දිවුරුම් සහතිකයක් ලබා දිය යුතුය.
4. එසේ නොමැති නම් හේතුව සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ග්‍රාම නිලධාරීගේ සහතිකය සහිතව ඉදිරිපත් කල යුතුය.
5. අවස්ථානුකූලව ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලුම් කරන ලියවිලි .

**වෙළඳ කටයුතු නතර කිරීම**

1. අයදුම් පත්‍රය
2. ග්‍රාම නිලධාරී සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි පිටපත
3. ව්‍යාපාරය නතර කර ඇති බවට ග්‍රාම නිලධාරී වෙතින් ලබා ගන්නා වාර්තාව. (අයදුම් පත්‍රය සමඟ ලබා දේ.)
4. රු.50ක මුද්දරයක් සහිතව සාමදාන විනිශ්චයකරුවෙක් විසින් දිවුරුම් ප්‍රකාශනයක් ලබා දිය යුතුය. (ආකෘතිය අමුණා ඇත. )
5. ව්‍යාපාර නාමය ලියාපදිංචි කරන ලද සහතිකයේ මුල් පිටපත.
6. අවස්ථානුකූලව ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලුම් කරන ලියවිලි .
7. ව්‍යාපාරය නතර කිරීම මාසයක් ඇතුලත දැනුම් දිය යුතුය.